# කොවිඩ්-19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිලිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සෑම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. කොවිඩ්-19 සම්ප්‍රේෂණය වැළක්වීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා වැඩිදුර තොරතුරු ලබා ගැනීමට - කරුණාකර

http://eohfs.health.gov.lk/occupational/index.php?option=com_content&view=article&id=61&Itemid=208&lang=en වෙත යොමු වන්න.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL

සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය

World Health Organization Sri Lanka

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

# 47. මහජන විරෝධතා

සැලකිය යුතු පොදු හේතුවක් වෙනුවෙන් විරෝධතා සිදු කිරීමට මහජනතාවට අයිතියක් ඇත. වර්තමාන තත්ත්වය තුළ, COVID-19 පැතිරීම වැළැක්වීම සඳහා ශාරීරික දුරස්ථභාවය, මුහුණු ආවරණ පැළඳීම ඇතුලු වෙනත් ක්‍රම දැඩිව අනුගමනය කල යුතුය. උද්ඝෝෂණයකදී පහත සඳහන් දෑ පිළිපැදිය යුතුය. උද්ඝෝෂකයින් අතර භෞතික දුරස්ථභාවය තබා ගත නොහැකි ප්‍රචණ්ඩකාරී හා උණුසුම් හැසිරීම් ඇතිවිය හැකි උද්ඝෝෂණ පැවැත්වීම සඳහා අවසර ලබා දිය නොහැක.

**නිශ්චිත පණිවිඩ / උපදෙස්**

**සංවිධායකයින් සඳහා**

- උද්ඝෝෂණය පවත්වන දිනය, වේලාව, පවත්වන කාල සීමාව හා අනුමාන කරන පැමිණෙන උද්ඝෝෂකයින්ගේ සංඛ්‍යාව පිළිබඳව සඳහන් කරමින් අවම වශයෙන් දින 3 කට පෙර ප්‍රාදේශීය පොලිස් ස්ථානයෙන් උද්ඝෝෂණය සඳහා අනුමැතිය ලබා ගත යුතුය
- සියලුම සහභාගිවන්නන් අතර මීටර 1 ක අවම දුරක් පවත්වා ගෙන යන බවට සහතික විය යුතු අතර, විරෝධතාව සිදු කරන මුළු කාලය පුරාවටම මුහුණු ආවරණයක් පැළඳිය යුතුය
- උණ හෝ වෙනත් ශ්වසන රෝග ලක්ෂණ ඇති අය උද්ඝෝෂණයට සහභාගී නොවීමට වග බලා ගත යුතුය
- ඕනෑම වේලාවක උපරිම වශයෙන් සහභාගිවන්නන් 30 දෙනෙකුට පමණක් අවසර දෙනු ලැබේ
- සියලුම සහභාගිවන්නන්ගේ නම් සහ සම්බන්ධ කර ගත හැකි තොරතුරු සහිත ලැයිස්තුවක් පවත්වා ගත යුතුය
- විරෝධතා එළිමහන්, හොඳින් වාතාශ්‍රය ඇති ස්ථානවලට සීමා කළ යුතුය
- විරෝධතාවය සඳහා එම මාර්ගයේ ගමන් කරන්නන් සම්බන්ධ කර නොගන්න
- අත් පත්‍රිකා, ස්ටිකර් ආදී කිසිවක් මහීන්ට ලබා නොදෙන්න
- විරෝධතාවය අතරතුර ආහාර වර්ග හෝ බීම වර්ග ලබාදීම නොකළ යුතුය
- ලබා දී ඇති උපදෙස් වලට අනුකූල වන බව දක්වමින් ඔබ විසින් එකඟතා ප්‍රකාශය පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එකගතා ප්‍රකාශයේ මුල් පිටපත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වෙත යැවිය යුතුය. එහි පිටපතක් අදාළ පළාත් පාලන ආයතනයට (මහ නගර සභාව / නගර සභාව / ප්‍රාදේශීය සභාව) යැවිය යුතු අතර තවත් පිටපතක් තමන් සතුව තබා ගත යුතුය. ඉහත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සංවිධානය කරන්නාගේ වගකීම වේ

**සහභාගිවන්නන් සඳහා**

- ඔබට උණ සහ / හෝ වෙනත් ශ්වසන රෝග ලක්ෂණ ඇත්නම් විරෝධතාවයට සහභාගී නොවන්න
- උද්ඝෝෂණය පුරාවටම අන් අයගෙන් මීටර් 1 ක දුරක් පවත්වා ගන්න
- උද්ඝෝෂණය පුරාවටම මුහුණු ආවරණයක් නිසි ලෙස පැළඳ සිටිය යුතු අතර එය දහඩියෙන් පෙඟී ඇත්නම් එය මාරු කළ යුතුය
- නොසන්සුන් හෝ ප්‍රචණ්ඩකාරී නොවන්න. කිසිවිටක ශාරීරික ගැටුම් වලට මැදිහත් නොවන්න.
- සහභාගිවන්නන් සමඟ පුවරු සහ බැනර් බෙදා ගැනීමෙන් වළකින්න
- පහසුකම් තිබේ නම්, සබන් හා වතුරෙන් අත් සේදීම හෝ විරෝධතාවයට පෙර සහ පසු ඇල්කොහොල් අඩංගු අත් පිරිසිදුකාරයක් භාවිතා කර දෑත් විෂබීජහරණය කර ගන්න
- ඕනෑම වේලාවක උපරිම වශයෙන් සහභාගිවන්නන් 30 දෙනෙකුට අවසර දෙනු ලැබේ. මෙම සංඛ්‍යාව ඉක්මවා ඇත්නම් සහභාගී නොවන්න
- ඔබ නිවසට පැමිණි විගස සම්පූර්ණයෙන් පිරිසිදු වන්න. ඔබේ සියලු ඇඳුම් සෝදන්න
- තැන තැන ස්පර්ශ කිරීමෙන් වළකින්න. (නිතර ස්පර්ශ කරන ලද මතුපිට උදා. දොර හැසිරවීම්, පඩි පෙළවල් වල ඇඳි ආදිය)

<u>කොවිඩ්-19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිලිබඳව උපදෙස්</u>

**නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්**

- විරෝධතාවය ආරම්භයේදී සහ අනතුරුදී සියලුම සහභාගිවන්නන් පිළිපැදිය යුතු උපදෙස් දැනුම් දෙන්න




සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.